# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## රියදුරු තනතුර සඳහා බඳවා ගැනීම ( අභ්‍යන්තර )

- වාහන හොඳ තත්ත්වයෙන් ආරක්ෂිතව තබා ගැනීම සහ නිසි ආකාරයෙන් නඩත්තු කිරීම.
- වාහන සඳහා භාවිතා කරන සියලුම ලිහිසි තෙල් සහ අමතර ද්‍රව වර්ග නිතිපතා සේදීම, පිරිසිදු කිරීම සහ පරීක්ෂා කිරීම.
- වාහනවල ආරක්ෂාව සඳහා වගකිව යුතු වීම.

- **අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව, අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

**සහ**

තාර බර හොණ්ඩර 24 ට අඩු පුද්ගලික හෝ කුලී මෝටර් රථ සහ ස්ටේෂන් වැගන් රථ ධාවනය සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම . ( බඳවා ගැනීමේ දිනයට පෙර අවම වශයෙන් වසර 03කට පෙර C හා C1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව B පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබාගෙන තිබිය යුතුය.)

**සහ**

මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු වීම .

**සහ**

මෝටර් රථ රියදුරෙකු ලෙස වසර 3 ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතු වීම. (සේවා පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය)

- **බඳවා ගැනීමේ පටිපාටිය**

ප්‍රායෝගික පරීක්ෂණයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

- **වැටුප :-** TRC 10.1 -Rs. 78,826 (10x994) -(10x1408)-(10x2112)-(10x2816) – 152,126
- **වයස :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-45 විය යුතුය.

- **පොදු කොන්දේසි**
  - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පත්කිරීම් කාණ්ඩයේ VI වන පරිච්ඡේදයේ 77 වන වගන්තිය ප්‍රකාරව මෙම පත්වීම වසරක වැඩ බලන කාලයකට යටත් වේ.
  - බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
  - අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර ඉහත දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් එම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලත් අය ලෙස සලකනු ලැබේ.
  - ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ

- **අයදුම් කිරීමේ ක්‍රමය:**

අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් තම අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත් සහ අංශ ප්‍රධානියාගේ නිර්දේශය සමඟ, අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනයට පෙර පාලන හා ආයතනික කටයුතු අංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026.06.01 වේ.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක .276
ඇල්විටිගල මාවත
කොළඹ 08

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**රියදුරු තනතුර සඳහා අයදුම්පත්‍රය ( අභ්‍යන්තර )**